# Trekmentor

Buddhism | State Governance | World Peace

https://www.trekmentor.com/ https://www.lankagov.org/ info@trekmentor.com

කමල් වික්‍රමනායක
41/1, රඹුක්කන පාර,
මාවතගම

දිනය: 2026-01-14

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
20, වෝඩ් පෙදෙස,
කොළඹ 07

**<u>භික්ෂූන් වහන්සේලාට වැටුප් ගෙවීම නවතාලන ලෙස ඉල්ලීම</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල ඇතුලු රාජ්‍ය ආයතනවල වැටුප් ලබමින් භික්ෂූන් වහන්සේලා සේවය කරන බව මා හට නිරීක්ෂණය වී ඇත.

බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව මුදල් පිළිගැනීම හෝ භාවිතය භික්ෂූන් වහන්සේලාට අකැප ක්‍රියාවකි. ඊට අනුරූප විනය ශික්ෂාපද දෙකක් පවතියි:

මුදල් පිළිගැනීම කැප නැති බවට අදාළ ශික්ෂා පදය:
**රූපිය ශික්ෂාපදය**
https://thripitaka.org/view/bjts/vp1/606

මුදල් භාවිතය කැප නැති බවට අදාළ ශික්ෂා පදය:
**රූපියසංවොහාර ශික්ෂාපදය**
https://thripitaka.org/view/bjts/vp1/610

උත්තරීතර නීතිය වන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාව මෙසේ වේ:

> *"9. ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10 වැනි ව්‍යවස්ථාවෙන් සහ 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලු ම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය."*

එබැවින් බුද්ධ ශාසනයට හානි වන අයුරින් විශ්වවිද්‍යාල ඇතුලු රාජ්‍ය ආයතන කටයුතු කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි ක්‍රියාවකි.

තවද ශ්‍රී ලංකාවාසී සැමගේ යුතුකම් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 ව්‍යවස්ථාවේ සඳහන් කරුණුවලට ද ඔබගේ අවධානය යොමු කරවමි:

*"28. අයිතිවාසිකම් සහ නිදහස ක්‍රියාත්මකවීමත්, භුක්ති විඳීමත් යුතුකම් හා බැඳීම් ඉටු කිරීමෙන් වෙන්ව පැවතිය නොහැක්කේ ය. එහෙයින්-*

*(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ආරක්ෂා කොට අනුගමනය කිරීම ද,*

*(ආ) ජාතික අභිවෘද්ධිය වර්ධනය කිරීම හා ජාතික සමගිය පෝෂණය කිරීම ද,*

...

*ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තකුගේම යුතුකම වන්නේ ය."*

අතිරේක වශයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 1.3 වගන්තිය ප්‍රකාරව ද ඔබ යටතේ වන ආයතනවල කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වීම තහවුරු කෙරී ඇත.

තවද භික්ෂූන් වහන්සේලාට රියැදුරු බලපත් නිකුත් කිරීම වළකාලමින් 2014 වසරේදී ගරු අභියාචනාධිකරණය CA/1978/2004, CA/1458/2006 සහ CA/1459/2006 රිට් අයැදුම්පත් ප්‍රතික්ෂේප කරන ලදී. ගරු අභියාචනාධිකරණය එම තීරණයට එළැඹීමට සලකා බැලූ කරුණු මා විසින් මෙම ලිපියෙන් කරන ඉල්ලීමට ද අදාළ කරගත හැක. අවශ්‍ය වේ නම් අදාළ ආඥාවේ පිටපතක් අන්තර්ජාලයෙන් ලබා ගත හැක.

එසේ හෙයින් බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම උදෙසාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවින් මිදී ඊට අනුගත වීම සඳහාත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ඒ යටතේ පාලනය වන සියලු රාජ්‍ය ආයතනවල වැටුප් ලබමින් රැකියා කරන භික්ෂූන් වහන්සේලාගේ වැටුප් ගෙවීම ස්ථිරව නවතාලීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි. මෙය මාස 3-6 පමණ කාලයක් තුළ ක්‍රියාවට නැංවීම සාධාරණ වේ යැයි සිතෙන බැවින් එසේ කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

මේ පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තීරණය සාධාරණ කාලයක් තුළ මා වෙත ලිඛිතව දන්වා සිටින මෙන් ද ඉල්ලා සිටිමි. මෙම ඉල්ලීමට අනුව කටයුතු නොකිරීමට තීරණය කෙරේ නම් ඊට හේතු ද දන්වා සිටින මෙන් ඉල්ලා සිටිමි.

ස්තූතියි.

කමල් වික්‍රමනායක